# නව යොවුන්වියේ ඔබේ චර්යාවන් අවදානම් ද?



**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

*සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය*

# දරුවන්ගේ නොගැලපෙන චර්යා රටාවන්

**නව යොවුන්වියේ දූදරුවන්ගේ ජීවිතවලට පීඩාවක් අයහපතක් සිදුවන්නේ පවුලේ අනෙකුත් සාමාජිකයින් හෝ බාහිර පුද්ගලයින්ගෙන් විතරක් නෙමේ. අපි වැඩිය හිතන්නේ නැති වුනත් නව යොවුන්වියේ පසුවන දරුවන්ගේ අයහපත් චර්යාවන් ද ඔවුන්ට පීඩාවක් ගෙන දෙන්න තදින්ම බලපානවා. සමහර චාර්යාවන් ඉතාම අවදානම්. ඔවුන්ට ඒක නොතේරෙනවා වෙන්න පුළුවන්**

**මොනවාද මෙ අවදානම් සහගත චර්යාවන් කියන්නේ, ඇයි ඒවායෙන් නරක ප්‍රතිඵල ලැබෙනවාද?**
**ඒ කියන්නේ..................................**

- දරුවන්ගේ ජීවිත හානිවීම්
- තුවාල සිදුවීම්
- මානසික බිඳවැටීම්
- අධ්‍යාපනය අඩාලවීම
- රෝගාබාධවලට ලක්වීම
- ආත්ම විශ්වාසය බිඳවැටීම
- යහපත් සම්බන්ධතා බිඳවැටීම්වලට හේතුවන ඕනෑම හැසිරීමක්







## මොනවද මේ යහපත් සබඳතා බිඳවැටීම්වලට හේතුවන චර්යාවන්

- මත්ද්‍රව්‍ය භාවිතය හා ඇබ්බැහිවීම
- දුම්පානය හා දුම්වැටි භාවිතය
- අධික වේගයෙන් හා අපරීක්ෂාකාරීව රිය පැදවීම
- නොදන්නා පුද්ගලයින් සමඟ ඇසුර
- බාල වයස් ප්‍රේම සම්බන්ධතා
- පාසල් නොයාම හා පාසල් වැඩ කටයුතු මඟ හැරීම
- වැඩිහිටියන් ඇතුලු අන් අයට ඇහුම්කන් නොදීම
- අන් අයව අපහසුතාවයට පත්කිරීම ප්‍රචණ්ඩකාරී හැසිරීම
- පෞද්ගලික පවිත්‍රතාව පවත්වාගෙන නොයාම
- අනවශ්‍ය ලෙස ආහාර ගැනීම සීමාකර ගැනීම
- අධික ලෙස සීනි/ ලුණු/ තෙල් ඇතුළත් ආහාර භාවිතය හා ක්ෂණික බීම පානය
- අධික ලෙස නිදි මැරීම
- අනවශ්‍ය ලෙස පරිගණක හා පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහිවීම
- ලිංගික හා ප්‍රජනන අධ්‍යාපනයට අදාළ නොවන අසභ්‍ය දර්ශන නැරඹීම
- අත්‍යාවශ්‍ය නොවන කටයුතු සඳහා රාත්‍රී කාලයේ නිවසින් බැහැරට යාම
- අවදානම් සහිත ක්‍රීඩාවල නිරතවීම
- අනවශ්‍ය ලෙස කල්ලි ගැසීම හා කල්ලි වලට සම්බන්ධවීම

- තනිව ජනරාශී වන තැන්වල හා අවිධිමත් උත්සව ආදියට සහභාගී වීම.
- අවදානම් සහිත පුද්ගලයින් ඇසුරු කිරීම
- අවදානම් සහිත තැන්වලින් /පුද්ගලයින්ගෙන් බැහැර නොවීම
- අවදානමක් අනතුරක් හැගුණ අවස්ථාවක කිසිවෙකු දැනුවත් නොකිරීම.

## *දරුවන්ගේ චර්යාවන්, ගති පැවතුම් ඔවුන්ගේ ආරක්ෂාවට තදින් බලපානවා. අපි කතා කරපු අවදානම් සහිත චර්යාවන් වලින් මුළුමනින්ම ඈත්වෙන්න.*

*දරුවන්ට අයහපත් චර්යාවලින් ඈත්වෙන්න දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් කොහොමද සහාය වෙන්නේ,*

- ළමයින්ට අවශ්‍ය ආදරය සෙනෙහස නොඅඩුව ලබාදීමෙන්
- ළමයින් සමඟ හොඳ සුහදතාවයක් හා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමෙන්
- දරුවන්ට ඇහුම්කන් දීමෙන්
- දරුවන්ට නිර්මාණශීලිව නිදහසේ වැඩ කරන්න ඉඩදීමෙන්/ පෙළඹවීමෙන්
- දරුවන්ගෙන් සිදුවන වැරදි හා අත්වැරදීම් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමෙන්
- හරි වැරදි දේ හඳුනාගන්න. ඒ අනුව හරි දේ තෝරාගෙන හරි දේ කරන්න ළමයින්ට මඟ පෙන්වීමෙන්
- දඬුවම් කරනවාට වඩා ඔවුන් ඉදිරියේ ඔබ ආදර්ශමත් වීමෙන්
- දරුවන්ගේ යහපත් ක්‍රියා අගය කිරීමෙන්

- දරුවන් මුහුණදෙන විශේෂ කායික හෝ මානසික පීඩාකාරී තත්ත්වයන් වලදී නොපමාව වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ලබා දීමෙන්
- ළමයින්ට ළමා අයිතිවාසිකම් වගේම ඔවුන්ගෙන් බලාපොරොත්තුවන යුතුකම් පහදා දීමෙන්
- දරුවන්ට ඇතිවන ගැටලුවකදී පිහිට පැතිය යුතු නිවැරදි පුද්ගලයින්/ ආයතන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමෙන්
- ළමුන් නිවාස තුළ හුදෙකලා නොකිරීම
- අවදානම් සහිත තැන්වලින් හෝ පුද්ගලයින්ගෙන් හැකි ඉක්මනින් ඉවත් වෙන්න උපදෙස් ලබා දීමෙන්

## මේ අවදානම් සහිත හැසිරීම් ඇතිවෙන්න බාහිර හේතුත් බලපානවද?
## ඔව් බලපානවා..........

- නරක මිතුරන් ඇසුරු කිරීම
- දෙමාපිය රැකවරණය අහිමිවීම/ දෙමාපියන් විසින් දරුවන් මඟ හැරීම
- මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් හා මත්ද්‍රව්‍ය භාවිත ජාවාරම්කරුවන්
- දරුවන් මෙහෙකාර සේවයට යොදා ගන්නන්
- සමාජ මාධ්‍ය/ වෙබ් අඩවි මඟින්
- අසභ්‍ය පුවත්පත් /වැඩසටහන් මඟින්
- සමාජ මාධ්‍ය ඔස්සේ උත්සව සංවිධානය කරන්නන් හා ඒවා සඳහා සහභාගීවන්නන්
- සමාජ විරෝධී කණ්ඩායම්වල පුද්ගලයින්ගෙන්
- නොගැලපෙන පෙම්වතුන් හෝ පෙම්වතියන්
- පාසල් මඟ හැරයන ළමුන්ගෙන්
- ත්‍රීරෝද රථ හා වාහන රියදුරන්ගෙන්
- සම්බාහන ආයතන පවත්වාගෙන යන්නන්
- අනවශ්‍ය ලෙස උපකාර කිරීමට පෙළඹෙන පුද්ගලයින්
- මානසික ගැටලු පවතින පුද්ගලයින්ගෙන්